ආයතනයේ නම :- වරාය හා නාවික හා ගුවන්සේවා අමාත්‍යංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 ( 4 ) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

நிறுவனத்தின் பெயர் :- துறைமுகங்கள்இ கப்பல்துறை மற்றும் விமான சேவைகள் அமைச்சு

பாராளுமன்றத்தில் அரசாங்க கணக்குகள் தொடர்பான குழு நிலையினால் அட்டவணைப்படுத்தப்பட்ட அறிக்கைகள் தொடர்பில் நிலையியற் கட்டளை இல 119 (4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்கள் மற்றும் எடுக்கப்பட்ட நடவடிக்கைகளை பாராளுமன்றில் சமர்ப்பித்தல

Name of the Institution: -The Ministry of Ports, Shipping & Aviation

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No.119(4)

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාල අංක 183

ආයතනයේ නම : වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය

| | කමිටුව විසින් හඳුනාගත් දුර්වලතා | දුර්වලතා මඟ හරවා ගැනීම සඳහා ගත ක්‍රියාමර්ග /වර්තමාන තත්වය |
|---|---|---|
| 01 | 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි | මූල්‍ය නීතිරීති හා කාර්ය සාධනය පිළිබඳව නියමයන් සඳහා අනුගතවීමේ ප්‍රතිශතය සම්බන්ධයෙන් වූ අදාල කාර්ය සාධන ඇගයීම ප්‍රකාරව අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳව පරීක්ෂාවන් කර නොතිබුණු බව පෙන්වා දී ඇත.<br>ඉහත සඳහන් අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳව පරීක්ෂාවක් 2020 වර්ෂයේ සිදු කර ඇති අතර පැවති ඉන්ධන අර්බුධය හේතුවෙන් වහනවල ඉන්ධන ටැංකි සම්පූර්ණයෙන් පිරවීමට නොහැකිවීම මත 2021 හා 2022 වර්ෂ සඳහා ඉහත සඳහන් ඉන්ධන පරීක්ෂාව නිසි පරිදි ඉටු කිරීමට නොහැකි වී ඇත.එසේ වුවද නැවත ඉන්ධන ලබාදීම පෙර වර්ෂයන්ට සාපේක්ෂව සාධනීය මට්ටමකට පැමිණ ඇති බැවින් 2023 වර්ෂය සඳහා අමාත්‍යාංශයේ වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂා කිරීමට කටයුතු කරමින් පවතින බව වැඩිදුරටත් සඳහන් කරමි. |
| 02 | මු.රෙ 94 (1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැදීම් ඇති කරගෙන තිබුණි. | ප්‍රතිපාදන නොමැතිවීම කොන්ත්‍රාත්කරුවන් සමඟ සේවා සපයන බාහිර පාර්ශවයන් සමඟ එම බැරකම්වලට එළඹී නොමැත. මු.රෙ 94 (1) ප්‍රකාරව කටයුතු කරනු ලැබේ. |
| 03 | වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. | 2022.12.31 දින වන විට අයකර ගැනීමට නොහැකිව තිබූ ස්ථාන මාරු වී ගිය දිනය නිශ්චිතව සඳහන් නොවන නිලධාරීන් දෙදෙනෙකුගෙන් අය විය යුතු රු.119,200.00 ක් වූ ණය ශේෂය 1990 දශකය තරම් පැරණිය. එම ණය ශේෂ කපා හැරීමට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් කරන ලද අතර එහි නිර්දේශයන් අනුව ණය ශේෂය කපා හැරීමට කමිටුවක් පත්කර කරුණු අධ්‍යනය කර කමිටු වාර්තාව 2019.10.18 දින ඉදිරිපත් කරන ලදී.<br>වැඩ තහනමට ලක්ව ඇති ජේ.ඒ. ආරියසේන මහතාගෙන් අයවීමට නියමිත රු.293,470.00 ක ණය ශේෂය එම මහතාට විරුද්ධව අල්ලස් හා දූෂණ විමර්ශන කොමිෂන් සභාව විසින් මහාධිකරණයේ පවරා ඇති නඩු තීන්දුව මත එම නිලධාරියා අභියාචනාධිකරණයේ ගොනු කර ඇති නඩුව 2022.03.08 දින විභාගයට ගත් අතර එහි තීන්දුවෙන් ඔහු වැරදිකරු ලෙස ප්‍රකාශයට පත් කර ඇත. ඔහුට ණය ශේෂය ගෙවන ලෙස 2022.08.26 සහ 2022.11.29 යන දිනවල දන්වා ඇත. |

| | | |
|---|---|---|
| | | |
| 04 | මු.රේ 371ප්‍රකාරව නිකුත් කළ තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි. මු.රෙ 371 හි වන සීමාව ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි. | මු.රෙ 371 ප්‍රකාරව තත්ත්කාර්ය අතුරු අග්‍රිම සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ |
| 05 | පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. ආයතනයේ පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි. සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි | මෙම අමාත්‍යාංශයිය පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය මේ වන විට සකස් කර සියලුම අංශයන් වෙත ලබාදීමට කටයුතු කර ඇති අතර එය අමාත්‍යාංශයිය වෙබ් අඩවියේද පල කිරීමටද කටයුතු යොදා ඇත. එම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම එකී සේවාවන් වඩාත් ඵලදායිව හා ගුණාත්මකව සැපයීම තහවුරු කර ගැනීම පිණිස අධීක්ෂණ හා ඇගයීම කමිටුවක් පත් කිරීමට කටයුතු කර ඇති බව කාරුණිකව සඳහන් කරමි.තවද ප්‍රඥප්තිය මෙම ආයතනය තුල අපේක්ෂිත මහජන සේවාවන් සාර්ථකව ඉටු කරලීමට සමත්වී ඇත්ද යන්න පිළිබඳව කාර්තුමය වශයෙන් ඇගයීම කර වාර්තාවන් ලබා ගැනීමට කටයුතු කර ඇති බව වැඩිදුරටත් සඳහන් කරමි. |

ජේ.ඒ.එස්. රුවන්චන්ද්‍ර
ලේකම්
වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය
අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01.